රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන ආශ්‍රිත නිලධර ගණයේ සංවර්ධන සම්බන්ධීකාරක නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

**1.0 හැඳින්වීම**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වන පරිච්ඡේදයේ 251 රීතියේ විධිවිධානවලට අනුකූලව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයට අනුයුක්තව සේවය කරන සංවර්ධන සම්බන්ධීකාරක නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය.

**2.0 වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත්වන නිලධරයන් පිළිබඳ විස්තර**

2.1 වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත්වන නිලධරයන්

2.1.1 අනිවාර්යයෙන් ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන්

සංවර්ධන සම්බන්ධීකාරක නිලධාරි II ශ්‍රේණිය
සංවර්ධන සම්බන්ධීකාරක නිලධාරි I ශ්‍රේණිය

2.1.2 ඉල්ලුම් කළ හැකි වෙනත් නිලධාරීන්

අනිවාර්යයෙන්ම ස්ථාන මාරු සඳහා යටත්වන නිලධාරීන්ට අමතරව ස්ථාන මාරු අපේක්ෂිත අනෙකුත් නිලධාරීන්ටද අයදුම් කළ හැකිය. කෙසේ වෙතත් මෙම ඉල්ලීම සම්බන්ධයෙන් සළකා බලනු ලබනුයේ ඔවුන් සාධාරණ සේවා කාලයක් වර්තමාන සේවා ස්ථානයේ සේවය කර ඇත්නම් පමණි. එකී ඉල්ලීම් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

2.2 සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය

2.2.1 තමා දැනට සේවයේ යෙදී සිටින සේවා ස්ථානයේ අඛණ්ඩව වසර තුනක (03) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.2.2 එකම සේවා ස්ථානයක වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත්වේ.

2.2.3 එකම දිස්ත්‍රික්කය තුළ ඛණ්ඩව හෝ අඛණ්ඩව වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් (ස්ථාන මාරු සළකා බලන වසරට) ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

2.2.4 සේවා අවශ්‍යතාවය මත හෝ සුහද ස්ථාන මාරු මත ස්ථාන මාරු සිදුකරන ලද නිලධාරීන් ස්ථාන මාරුව ක්‍රියාත්මක වූ දින සිට නව සේවා ස්ථානයේ වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

2.3 ක්‍රමවේදය සහ අනෙකුත් කරුණු

2.3.1 මෙම ප්‍රතිපත්තියෙහි අංක 2.2.1 හා 2.2.2 යටතට ගැනෙන නිලධරයෙකු ස්ථාන මාරු ඉල්ලා ඇති විට2.2.3 හි අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කළ හැකිය.

2.3.2 ස්ථාන මාරු ක්‍රියාත්මක වීමට නියමිත වර්ෂයේ ජනවාරි 01 දිනට වයස අවුරුදු 57 ඉක්මවන නිලධාරියෙකු ස්ථාන මාරු වීමට ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැතිනම් විනය හේතු හෝ රාජකාරී අවශ්‍යතා හැර අනෙකුත් අවස්ථාවන්හිදී විශ්‍රාම යනතෙක් එම සේවා ස්ථානයේ සේවය කිරීමට ඉඩදෙනු ලැබේ.

2.3.3 ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොකරන්නේ නම් අමාත්‍යාංශ ලේකම් විසින් වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව කටයුතු නොකරන නිලධාරීන්ගෙන් එසේ කටයුතු නොකිරීමට හේතු විමසනු ලැබේ.

2.4 සේවා කාලය ගණනය කිරීම

2.4.1 වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී සේවා කාලය ගණනය කරනු ලබන්නේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය.

2.4.2 සේවා කාලය ගණනය කිරීමේදී සේවා ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු කමිටුව විසින් ඒ පිළිබඳව සැළකිල්ල යොමු කරනු ලැබේ. (තව ද නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ).

2.4.3 දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී එකම දිස්ත්‍රික්කයක් තුළ කුමන කාර්යාලයක සේවය කළ ද සේවා කාලය ඛණ්ඩව හෝ අඛණ්ඩව වුවද එම සේවා කාලය එම දිස්ත්‍රික්කය තුළ සේවය කළ සේවා කාලය ලෙස ගණන් ගැනේ.

2.4.4 සේවා ස්ථානයක දැනට සේවයේ නියුතු නිලධාරිනියකගේ සේවා ස්ථානයක සේවා කාලය ගණනය කිරීමේ දී අදාළ කාලය තුළ ලබාගෙන ඇති ප්‍රසූත නිවාඩු (වැටුප් සහිත, අඩ වැටුප් හා වැටුප් රහිත) කාලය හා වෛද්‍ය හේතු මත අඛණ්ඩව මසකට නොවැඩිව නිවාඩු ලබා සිටි කාලය සහ අධ්‍යයන නිවාඩු ගණන් ගනු නොලැබේ.

**3.0 වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

සංවර්ධන සම්බන්ධීකාරක නිලධාරීන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු කමිටුව මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලැබේ. ස්ථාන මාරු අපේක්ෂිත නිලධාරීන්ගේ ඉල්ලීම් පිළිබඳව සළකා බැලීම, නිලධාරීන් වෙත සාධාරණ කාල පරාසයක් තුළ ස්ථාන මාරුවීම් ක්‍රමානුකූලව ලබා දීම සහ නිලධාරීන් එකම සේවා ස්ථානයක දීර්ඝ කාලයක් තිස්සේ රැඳී සිටීම වැළැක්වීම පිණිස මාරුවීම් ක්‍රියාවලිය යොදවා ගැනීම කමිටුවේ කාර්යභාරය වේ.

3.1 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි 250(III)හි විධිවිධාන අනුව පත් කෙරේ.

**4.0 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කරන අභියාචනා සළකා බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ XVIII වන පරිච්ඡේදයේ කාර්ය පටිපාටික රීති 254 වගන්තියට අනුව ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවා, ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සළකා බලනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ XVIII වන පරිච්ඡේදයේ කාර්ය පටිපාටික රීති 254 වගන්තියට අනුකූල වේ නම් පමණි.

4.1 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින්හි 254(II) හි විධිවිධාන අනුව පත් කෙරේ.



na

## 5.0 වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැළකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

5.1 භාර්යාව සහ ස්වාමිපුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම්, එවැනි අවස්ථාවක ඔවුන්ගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කිරීමට ඉඩ ලබාදීමට මාරු කමිටුව සෑම උත්සහයක්ම දැරිය යුතුය.

5.2 නිලධාරියාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු නොමැතිනම් සාමාන්‍ය වශයෙන් අවුරුදු 58 ක් ඉක්මවූ නිලධාරීන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය. එසේ වුවත්, දිස්ත්‍රික්කය ඇතුළත ස්ථාන මාරු කිරීම් වලට යටත් වන්නේය.

5.3 ආබාධිත දරුවන්, දීර්ඝ කාලීනව අසනීප මත එක්තැන්ව සිටින කාලත්‍රයන්, වෛද්‍ය සහතික මඟින් සනාථ කර ඇති බරපතල රෝගාබාධවලින් පෙළෙන්නන් වැනි නිලධාරීන්ට මුහුණ දීමට සිදුවන විසඳා ගත නොහැකි ගැටලුවලදී පිළිගතහැකි කරුණු සහිතව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයන්ද සමඟ ඉදිරිපත් කරන ඉල්ලීම් සැළකිල්ලට ගෙන කටයුතු කළ යුතුය.

5.4 දරුවන් පාසල් යැවීමේ කටයුතුවලට අවහිරයක් නොවනු පිණිස හැකිතාක් දුරට සෑම මාරු කිරීමක් ම ලබා දීමට මාරු මණ්ඩලය සෑම උත්සහයක්ම දැරිය යුතුය.

5.5 දුෂ්කර ස්ථාන සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධාරීන්ට වඩා, අවිවාහක නිලධාරීන් හෝ පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධාරීන් හැකි සෑම අවස්ථාවකම තෝරා ගැනීමට සැළකිලිමත් විය යුතුය.

5.6 දුෂ්කර නොවන ස්ථානවල සේවය කරන නිලධාරීන් විසින් නැවතත් එවැනිම සේවා ස්ථානයක් ඉල්ලුම් කරනු ලබන විට එය සලකා බලනු ලැබිය හැකි වන්නේ එම සේවා ස්ථානවලට දුෂ්කර සේවා ස්ථානවල සේවය කරන නිලධාරීන් විසින් කරනු ලබන ඉල්ලීම සළකා බැලීමෙන් පසුවයි.

5.7 මෙම නිවේදනය පරිදි ස්ථාන මාරු අයදුම් කර නොකල නමුත් අපගේ දත්තයන්ට අනුව එක් සේවා ස්ථානයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කටයුතුවල නියැලීමට ඔවුන්ගේ විරුද්ධතාවයක් නොමැති යැයි සලකා ඔවුන් හට ස්ථාන මාරුවීම් ලබා දිය යුතුය ........... (පෙර වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක දිනය ) වර්ෂය තුළ දී ස්ථාන මාරු සිදු කරන ලද නිලධාරින් සම්බන්ධයෙන්ද මෙහිදී සලකා බලනු ලැබේ.

5.8 ස්ථාන මාරු ඉල්ලීමේදී හා අභියාචනා ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා හඳුන්වාදී ඇති ආකෘති පත්‍රය අනුවම සකස් කළ අයදුම්පත් පමණක් සළකා බලනු ලැබේ. ( ඇමුණුම් අංක 01 හා ඇමුණුම් අංක 02)

5.9 ස්ථාන මාරුවීම් නියෝග ලැබ සිටින නිලධාරියෙකු එම මාරුවීම ක්‍රියාත්මක දිනයට පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම ස්ථාන මාරු ප්‍රතිපත්තියට පටහැනිය. එබැවින්, මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක වීමෙන් පසු මෙම විධිවිධාන වලට පටහැනිව කටයුතු කරනු ලබන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට හැකි බැවින් ඒ සඳහා අදාළ බලධාරීන් වෙත වාර්තා කරනු ඇත. (රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්යය පරිපාටික රීති 257 වන වගන්තියෙහි සඳහන් විධිවිධාන බලපැවැත්වෙනු ඇත.)

5.10 මෙම නිලධාරින්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා දිස්ත්‍රික් ලේකම් වන බැවින් තම කාර්යාලය තුළ හා දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අදාළ ස්ථාන මාරු සම්බන්ධව සංවර්ධන සම්බන්ධීකාරක නිලධාරීන්ගේ අයදුම්පත් කැඳවා, අදාළ තොරතුරු පිළිබඳව සළකා බලා දිස්ත්‍රික්කය තුළ සිදු කරනු ලබන ස්ථාන මාරු යෝජනා කෙටුම්පතක් සකස් කර මෙම අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු වන බවට සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කළ යුතුය.

## 6.0 වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | |
|---|---|
| ජූනි මස 01 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම |
| ජූනි මස 30 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම |
| ජූලි මස 31 දිනට හෝ එදිනට පෙර | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම |
| අගොස්තු මස 10 දිනට හෝ එදිනට පෙර | අදාළ බලධාරියා විසින් අයදුම්පත් ස්ථාන මාරු කමිටුවට භාර දීම. |
| අගෝස්තු මස 31 දිනට හෝ එදිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම. |
| සැප්තැම්බර් මස 15 දිනට හෝ එදිනට පෙර | යෝජිත වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව පත් කිරීම. |
| සැප්තැම්බර් මස 30 දිනට පෙර | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය |
| ඔක්තෝම්බර් මස 15 දිනට හෝ එදිනට පෙර | වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම |
| නොවැම්බර් මස 01 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරුවීම් අවසාන නියෝග නිකුත් කිරීම |
| නොවැම්බර් මස 15 දිනට පෙර | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ අවසන් දිනය |
| ජනවාරි මස 01 දින | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම. |

nd

## 7.0 වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් නිලධාරියෙකු විසින් ස්වදේශ කටයුතු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් එය ඉදිරිපත් කළ යුතු වන්නේ, ඇමුණුම -02 ආකෘතිය අනුව තම ආයතන ප්‍රධානියා මඟින් වේ.

7.2 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.3 මෙහි 06 වන පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම නිලධාරියෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරන අභියාචනා සළකා බලනු නොලැබේ.

7.4 ඉහත 7.3 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 14 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධාරියෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් අමාත්‍යාංශය විසින් ගනු ඇත්තේය.

7.5 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ තීරණ සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන්නේය.

7.6 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනයේ සඳහන් කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමට ක්‍රියාකළ යුතු වන්නේය.

7.7 රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත, කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ 256 හි 1 වන වගන්තිය ප්‍රකාරව පරිශිෂ්ටය 16 අනුව අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මඟිනි. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ 256 හි V වන වගන්තිය ප්‍රකාරව පරිශිෂ්ටය 17 ද සමඟ තම නිරීක්ෂණ නිර්දේශ සහිතව අප්‍රමාදවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකිය.

7.8 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.9 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට ස්වදේශ කටයුතු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලාගත යුතු වන්නේය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ 255 වගන්තියෙහි සඳහන් වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධව අභියාචනා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 256 හි V වගන්තිය ප්‍රකාරව අදාළ ලිපිගොනු, ලිපිලේඛන, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ නොවැම්බර් 15 වන දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.



ná

7.10 මෙම පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනය ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

7.11 ඉහත 7.9 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබයි.

7.12 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපතක් අදාළ පරිදි ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත යවනු ලබන්නේය.

7.13 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත් වන රජයේ නිලධාරියෙකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

7.14 මෙම ස්ථාන මාරු පටිපාටියේ දක්වා නොමැති විධිවිධාන සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

8.0

| | |
|---|---|
| සකස් කළේ : | පරීක්ෂා කළේ : |
| අත්සන :............................................. | අත්සන:............................................. |
| (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) |
| නම : පී.ඩබ්ලිව්.එන්.ඩී. පෙරේරා | නම : කේ.ඩී.සී.එස්. කුමාරතුංග |
| තනතුර : සහකාර ලේකම් (ආයතන හා පුහුණු) | තනතුර : ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) |
| දිනය : 2026/01/21 | දිනය : 2026/1/14 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :.............................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ජී.සී.එස්. තිලකරත්න

තනතුර : අතිරේක ලේකම් (පාලන)

ජී.සී.එස්. තිලකරත්න
අතිරේක ලේකම් (පාලන)
(ස්වදේශ කටයුතු අංශය)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ
ලේකම් වෙනුවට

නිල මුද්‍රාව : .............................................

දිනය : 2026/01/22



69

යොමු අංකය : HA/05/01/30/4

2025.05.27 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන ආශ්‍රිත නිලධර ගණයේ සංවර්ධන සම්බන්ධීකාරක තනතුර සඳහා වන ස්ථාන මාරු පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන: ...........................

නම: එස්. ආලෝක බණ්ඩාර

ලේකම්

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

දිනය: 2026.01.22

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

නිල මුද්‍රාව: ...........................

යොමු අංකය : PSC/EST/08-04/25/04/2024

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන ආශ්‍රිත නිලධර ගණයේ සංවර්ධන සම්බන්ධීකාරක තනතුර සඳහා යෝජිත මෙම ස්ථාන මාරු පටිපාටිය 2025.05.27 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන: ...........................

නම: ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 2026-02-12

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කෙ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

නිල මුද්‍රාව: ...........................